# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/70 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බොරැල්ල ගෝතමී විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ‘‘බොරැල්ල ගෝතමී විහාර පූජාභූමිය’’ යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***බොරැල්ල ගෝතමී විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2010 ඔක්තෝබර් මස 21 වැනි දින අංක සී.ඕ./ටීඑච්අයි/2010/555 (මූලික පිඹුරු අංක කොː 9137) දරන සැලස්මේ නිරූපිත බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෝතමීපුර ග්‍රාම නිලධාරී වසමේ (කොට්ඨාශ අංක 35 බොරැල්ල දකුණ, කොළඹ මහ නගර සභා සීමාව තුල) බොරැල්ල ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 0.7343 ක් විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

| | | |
|---|---|---|
| උතුරට | ː | පාර, කුරුප්පු පාරේ වරිපනම් අංක 69/14 දරන ඉඩම සහ පාර; |
| නැගෙනහිරට | ː | දෙවන පටුමග සහ ගෝතමී පාර; |
| දකුණට | ː | ගෝතමී පාර, ගෝතමී පාරේ වරිපනම් අංක 83,83/10,81/1 දරන ඉඩම්; |
| බස්නාහිරට | ː | කුරුප්පු පාරේ වරිපනම් අංක නොදන්නා ඉඩම, කුරුප්පු පාරේ වරිපනම් අංක නොදන්නා මුඩු ඉඩම, කුරුප්පු පාරේ වරිපනම් අංක 69/50 දරන ඉඩම, පාර සහ කුරුප්පු පාරේ වරිපනම් අංක 69/14 දරන ඉඩම. |

09 - 493

1A - G 20168 — 50 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*